# අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

මේ මා කියන්නට යන්නේ ඉහත මාතෘකාව දකින විට අපේ සිතේ සාමාන්‍යයෙන් ඇසෙන ආකාරයේ කතාවක් නම් නොවේ. මෙය ඊට වඩා ඉතා වෙනස් ආකාරයක කතාවක් බව මට ඔබට සහතික කර කිව හැකි ය.
එසේ ම, මේ අද ඊයේ සිදු වූ දෙයක් පිළිබඳව කතාවක් ද නොවේ. මේ සිදුවීම් දැන් සිව් වසරක් ම පැරණි ය. එදා සිට මේ දක්වා කාලය තුළ, මේ කතාව ලියා තබන්නට අවශ්‍ය යැයි මට වරින් වර සිතුණා ද, කුමක් දෝ හේතුවක් නිසා, මම ම එය දිගින් දිගටම කල් දැමුවෙමි.
අද වුව ද, මෙය මට ලියන්නට අත්‍යාවශ්‍ය ම යැයි සිතෙන කතාවක් නොවේ. එහෙත්, දැන් මෙය ඇරඹූ නිසා, අවසානය දක්වා ම ලියමි.

## එක්තරා යුවතියකගේ කතාවක්



අපේ කතානායිකාව ලංකාවේ ඉපිද, දෙමව්පියන් සමග මෙල්බර්න් නගරයට සංක්‍රමණය කර, එහි දී තම දෙවන උපන්දිනය සැමරූ ළදැරියකි. ඉන් පසු ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය ඉහළින් සමත් වූ තරුණියකි.

දෙමව්පියන්ගේ අඩි පාරේ නොයමින්, විද්‍යා ගණිත විෂයයන් අලුයම කෙළ පිඩු සේ ඉවත ලූ ඇය, මුලින් සිතා ගත්තේ මාධ්‍යවේදය පිළිබඳව විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් හදාරා, ඉන් පසුව පුවත්පත්කලාව තම ජීවන වෘත්තිය ලෙස තෝරා ගන්නට ය. නමුත්, ඒ දිනවල ඕස්ට්‍රේලියාවේ පුවත්පත් ක්ෂේත්‍රයේ සිදුවීම ඇරඹුණු මහා පසුබැස්ම නිසා ද, තමන් උසස් පෙළ විභාගයෙන් ඉතා ඉහළ ලකුණු මට්ටමක් ලබාගත් නිසා ද, නැවත සිතා බලා, ඇය තම විභාග ප්‍රතිඵල අනුව ලබා ගත හැකි හොඳම උපාධි පාඨමාලාව තෝරා ගත්තා ය.

එය නම්, කැන්බරා නුවර පිහිටි ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය මගින් පවත්වන නීතිය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳව පස් අවුරුදු ද්විත්ව උපාධියයි.
කැන්බරාවට ගොස් විශ්වවිද්‍යාලයේ නේවාසිකව පදිංචි වී පාඨමාලාව හදාරන්නට පටන් ගත් ඇයට, අවාසනාවකට හෝ වාසනාවකට හෝ එය තමන්ට නොගැලපෙන බව වැටහෙන්නට පටන් ගති.
"අන්තර්ජාතික සබඳතා විෂයයට නම් මං කැමතියි, ඒත් මේ නීතිය කියන්නේ නම් මං හිතාගෙන හිටපු ආකාරයේ ශාස්ත්‍ර ධාරාවේ විෂයයක් නොවෙයි, මහා කාලකණ්ණි විෂයයක්. මං නං ඒකට කැමතිම නෑ!" ඇය තම දෙමව්පියන්ට දුරකථනයෙන් පවසා සිටියේ එලෙස ය.

අරඹා සති හතරක් යන්නටත් පෙර ඒ විශ්වවිද්‍යාල පාඨමාලාවෙන් ඉවත් වූ ඇය, ආපසු නිවසට පැමිණියේ තම ප්‍රාන්තයේ පිහිටි විශ්වවිද්‍යාලයක මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියකට ඊළඟ වසරේ ලියාපදිංචි වීමේ අදිටනින්, එතෙක් ඇති කාලය ගැප්-ඉයර් හෙවත් වෙනත් කටයුතුවල යෙදෙන නිදහස් වසරක් කර ගත්තා ය.

මේ කාලය තුළ ඕස්ට්‍රේලියාවේ ක්‍රියාත්මකවන ප්‍රධාන පෙළේ ආයතන කිහිපයක ම, ස්වේච්ඡා සේවයේ යෙදීමට ඇයට වරම් ලැබුණි. ඒ අතරින් ප්‍රධානතම වූයේ, ගෝලීය පරිසරය පිළිබඳ කටයුතු කරන ග්‍රීන්පීස් නම් අන්තර්ජාතික සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හෙවත් යුනිසෙෆ් ආයතනයයි. මේ ආයතන ද, එමෙන් ම ඇය ස්වේච්ඡාවෙන් සේවය කළ වහල් විරෝධී සංවිධානය ද ඇය තම නිදහස් කාලය ගත කිරීම සඳහා තෝරා ගත්තේ, ඒ සියලු සංවිධානවල මුඛ්‍ය පරමාර්ථවලට ඇගේ ඇති දැඩි කැමැත්ත නිසා ය.

ඒ වසර ගෙවී ගොස් ඊළඟ වසර ඇරඹුණු පසු අපේ කතා නායිකාව තම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇරඹුවා ය. ඒ සඳහා නිවසේ සිට විශ්වවිද්‍යාලයට යාමට ඇත්තේ දින දෙකහමාරක් පමණක් නිසා, සතියේ ඉතුරු එක් දිනයක විශ්වවිද්‍යාලට නුදුරේ පිහිටා තිබුණු ග්‍රීන්පීස් ආයතනයේ තම ස්වේච්ඡා සේවය ද දිගටම කළා ය. ඒ සඳහා ඇයට ලැබුණේ එක් දිනක පොදු ප්‍රවාහන සේවා ගමන් ගාස්තුවට සමාන, ඩොලර් දහයක පමණ, දීමනාවක් පමණි.

මාස කිහිපයක් ගත වූ පසු ග්‍රීන්පීස් ආයතනයේ ඇගේ කළමනාකාරිනිය මාසයක රාජකාරියක් රටෙන් බැහැරව යන බැවින් ඒ කාලය තුළ සතියකට දින තුනක් හෝ සේවය කළ හැකි දැයි මේ යුවතියගෙන් විමසනු ලැබූ විට, ඇය ඒ සඳහා කැමැත්ත දී, විශ්වවිද්‍යාල ගමනට බාධා නොපැමිණෙන ලෙස තම සේවා කාලය යොදා ගත්තා ය.

මේ සේවය සඳහා ඇයට සුදුසුකම් සහ හැකියාවන්ට ගැලපෙන වේතනයක් ද ගෙවීමට නියමිත විය. තම පළමු රැකියාව පිළිබඳව ඇය සිටියේ ඉතා උද්දාමයෙනි. මුල් සති දෙක අවසානයේ දී තම මුල්ම වේතනය ලැබෙන දින අපේ කතානායක යුවතිය තම දෙමව්පියන් හා පැවසුයේ ඇදහිය නොහැකි කතාවකි.

"මේ සති හතරේ මට ලැබෙන සැලරි එක සේරම මම යුනිසෙප් එකේ අප්‍රිකාවේ ළමා රෝග නිවාරණ අරමුදලට දෙනවා!"

ඇයගේ අරමුණ වූයේ ඩොලර් දෙදහසක් පරිත්‍යාග කිරීම බව පසුව වැටහුණි. නමුත් ඇය තේරුම් නොගෙන සිටි කාරණය වූයේ ඇයට ක්ෂණිකව ගෙවීමට සිදුවන ඉන්කම් ටැක්ස් හෙවත් අයබදු ප්‍රමාණයයි.

කෙසේ වෙතත් ඒ සති හතරක කාලය ග්‍රීන්පීස් ආයතනයේ ඉතා ප්‍රයෝජනවත්ව ගත කළ අපේ කතා නායිකාව කළේ, තමන්ට දෙමව්පියන් වියදමට දුන් මුදලින් ද කොටසක් යොදා කෙසේ හෝ ඩොලර් දෙදහසක් පියවා එය ළමා අරමුදලට පරිත්‍යාග කිරීමයි.

"මාත් නිතරම ඔය චැරිටිවලට සල්ලි දෙනවා. ඒත් දුව කරපු ඒ පරිත්‍යාගය දැක්කාම මට මං ගැනම ලැජ්ජා හිතුණා!" යුවතියගේ මව මා සමග කීවා ය.
"මං මගේ මුල් පඩියෙන් ඉතුරු වුණු සල්ලිවලින් කරන්න සැලසුම් කළේ, දෙමව්පියන්ට, සහෝදරයින්ට තෑගි දෙන්න, චිත්‍රපටි බලන්න, කලිසම් කමිස ගන්න වගේ දේවල්. අපේ දුවගේ මේ අදහස් කොහෙන් ආවා ද දන්නේ නෑ!" ඒ මේ යුවතිය ගේ පියා ගේ අදහසයි.

මේ කතාවේ අවසානය තවත් රසවත් ය. සති හතරක සේවා කාලය අවසාන වෙන්නට පෙර සිදුවූයේ කිසිවෙකු නොසිතූ දෙයකි. රාජකාරිය සඳහා කාර්යාලයෙන් බැහැරව සිටි කළමනාකාරිනියගේ ආපසු පැමිණම, අන්තර්ජාතික සිදුවීමක් නිසා දින නියමයක් නොමැතිව කල් ගියේ ය. එනිසා, මේ යුවතියගේ සේවා කාලය තවත් මාස කිහිපයකට දිගු විය. එනිසා, තමන් ගේ මුදලින් තමන්ට අවශ්‍ය දේ මිලට ගන්නට, විනෝදවන්නට ඇයට අවස්ථාව ලැබුණි.
මාස කිහිපයක් අවසානයේ කළමනාකාරිනිය ආපසු පැමිණිය ද, ඒ වන විට ආයතනයේ සිදුවෙමින් තිබුණු වෙනස්කම් ද සැලකිල්ලට ගෙන, මේ යුවතිය පෙර කරමින් තිබුණු ස්වේච්ඡා කටයුතු සහ වෙනත් සේවා ද එක් කර ඒ සඳහා අලුත් පූර්ණකාලීන තනතුරක් ස්ථාපිත කෙරුණු අතර ඒ සඳහා මේ යුවතිය පත් කරන ලදී.

පූර්ණකාලීන විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක සහ අර්ධකාලීන සේවාදායකයෙකුව සිටි ඇය, අර්ධකාලීන විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක සහ සිත්ගන්නා සුළු වේතනයක් ලබන පූර්ණකාලීන සේවාදායකයෙකු බවට පත්වූවේ, අපට "දිට්ඨ ධම්ම වේදනීය" සංකල්පය සිහිපත් කරවමිනි.
අද සිව් වසරකට පසුවත්, එදා තමන් ජීවිතයේ රැකියාවකින් ලද මුල්ම ආදායම පොදු යහපත උදෙසා පූජා කිරීමේ දානමය කුසල කර්මය, "ඡායාව අනුපායිනී" ලෙස තවමත් ඇය සමග ම රැඳී සිටී.




දඹදිව

සියලු පහසුකම් සහිත සුඛෝපභෝගී
විශේෂ දඹදිව වන්දනා චාරිකා *

බුද්ධගයා, රාජ්ගිර්, වෛශාලි, කුෂිනගර්,
ලුම්බිණි / කපිලවස්තු, ශ්‍රාවස්ථි, වරණාසි

CHARIKA TRAVELS

**Special Pilgrimages for Dambadiva***

• Smaller Groups (ideal for families & friends) • 09 or 10 days Tours • Star Class Hotel Accommodation • Air-conditioned comfortable Vehicles (No Train travel) • Customised Tours if necessary *

* Terms & Conditions Apply. Minimum number of Passengers per group apply

**Contact us for details**

**www.charikatravels.com/dambadiva**

**Tel: (03) 8804 1488**

**Email: tours@charikatravels.com**

**Celink Australia Pty Ltd** trading as **CHARIKA TRAVELS**